# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1812/8 – 2013 මැයි 28 වැනි අඟහරුවාදා – 2013.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 168 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2012/එල්ආර්බී/222.
ඉ.අ.නිලධාරීගේ යොමු අංකය:
ඩබ්ජීඑස්ඩබ්ඩීසහර්අයිපී/ඒසීකිව්/කේබී/14.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 16 වැනි දින,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– වේරැස් ගඟ සංවර්ධන ව්‍යාපෘතිය.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙල්ලන්තර ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ඩීඑස්ඕ/2012/881 සහ 2013 ජනවාරි මස 21 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 සහ 2 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3804ක් පමණ වන පහත සඳහන් නම්වලින්, ප්‍රමාණයන්ගෙන් සහ මායිම්වලින් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.3478**

උතුරට: ඇළ; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි හික්ගහවත්ත මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම, හික්ගහවත්ත මාවතේ අංක 45/25, 45/25ඒ සහ 45/25සී දරන ඉඩම්; දකුණට: එම්. ඒ. අරුණි ප්‍රියානි හිමිකම් කියන විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම, එම්. ඒ. රොහාන් ප්‍රියන්ත හිමිකම් කියන විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම, විහාර මාවතේ අංක 32/7, 32/7බී සහ 32/එෆ් දරන ඉඩම්; බටහිරට: විහාර මාවතේ අංක 32/එෆ් දරන ඉඩම, හිමිකම් කියන අය සොයාගත නොහැකි විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම, කැබලි අංක 2, සුසන්ත කුමාර සහ තවත් අය හිමිකම් කියන විහාර මාවතේ අංක 71/7 දරන ඉඩම, විහාර මාවතේ අංක 4/2 දරන ඉඩම සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම.

02. **කැබලි අංක 02 – විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0326**

උතුරට: විහාර මාවතේ අංක 71/7 දරන ඉඩම; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 1; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි විහාර මාවතේ අංක සොයාගත නොහැකි ඉඩම.



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1795/22 හා 2013 ජනවාරි මස 30 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2012 අංක 15 සහ 2013 ජනවාරි මස 21 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙත පැවරී තිබේ. එනමුත් ඉඩමෙහි භුක්තිය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1795/22 හා 2013 ජනවාරි මස 30 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2012 අංක 15 හා 2013 ජනවාරි මස 21 වැනි දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/15/2011/වීඊ/224.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/3/6/2/14.
2013 මැයි මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ, හලංගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මා/යූකේඩබ්/2011/335 සහ 2012.01.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ හා බී ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.9578ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් :

01. **කැබලි අක්ෂර 'ඒ' – මස්සාගල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.9273ක් පමණ**

උතුරට: ඇල්කඩුව වැවිලි සමාගම හිමිකම් කියන මස්සාගල වත්ත, ඇළ, කේ. ඩබ්. ටිකිරිකුමාරිහාමි හිමිකම් කියන සෝදියාගේ ඉඩම සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: යූ. ජී. විජේරත්න සහ ආර්. ඒ. ඩී. බණ්ඩාරනායක හිමිකම් කියන ගල්දෙනිපිටිය වත්ත; දකුණට සහ බටහිරට: ඇල්කඩුව වැවිලි සමාගම හිමිකම් කියන මස්සාගල වත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – මස්සාගල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0305ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ කේ. ඩබ්. ටිකිරිකුමාරිහාමි හිමිකම් කියන සෝදියාගේ ඉඩම; නැගෙනහිරට: යූ. ජී. විජේරත්න හිමිකම් කියන ගල්දෙනිපිටිය වත්ත; දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර ඒ.

06 - 212

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 72 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2011/අයිආර්/188.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය:
එම්ටීආර්/එල්එන්ඩී/ඒසීකියුයූඅයි/එල්අයි/3921

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1799/30 හා 2013.03.01 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ පළ කරන ලද 2013 අංක 72 දරන ආඥාවේ ප්‍රාදේශීය ලේකම්ගේ අංක MTR/LND/ACQUI/LI/3920 යන්න MTR/LND/ACQUI/LI/3921 යන්න ලෙසත් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා ප්‍රාදේශීය ලේකම් දික්වැල්ල යන්න වෙනුවට ප්‍රාදේශීය ලේකම් මාතර ලෙසත් ඉඩමේ විස්තරය යටතේ සඳහන් දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යන්න දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යන්න ලෙසත් ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 16 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.